12th Academic Sessions
University of Ruhuna, Matara, Sri Lanka ISSN 2362-0412

# මහනුවර සම්ප්‍රදායට අයත් බිතුසිතුවම් කලාවෙහි උද්භිද විද්‍යාත්මක රූසටහන් භාවිතය (දකුණු පළාතේ තෝරාගත් විහාරස්ථාන කිහිපයක් ඇසුරින්)

එන්. ටී. එස්. තිලකරත්න[a] සහ උපේක්ෂා ගමගේ [b]
[b]*ඉතිහාසය සහ පුරාවිද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර සහ සමාජයීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*

[a]*Thusharisandya1990@gmail.com* [b]*upeksha_gamage@yahoo.com*

## සාරසංක්ෂේපය

මානව සංස්කෘතිය පෝෂණය කිරීමෙහිලා චිත්‍ර කලාවෙන් මහඟු ආලෝකයක් ලැබේ. එය ලාංකික ඉතිහාසයෙහි සහ සංස්කෘතියෙහි අනන්‍යතාව පෙන්නුම් කරනු ලබන බව එහි විවිධ පැතිකඩයන් මැනවින් අධ්‍යයනය කිරීමේ දී පෙනී යයි. මහනුවර සම්ප්‍රදායට අයත් දකුණු පළාතේ විහාර බිතුසිතුවම් ඒ අතරින් විවිධත්වයෙන් යුක්තය. දේශීය චිත්‍ර කලාව පිළිබඳ සලකා බලනවිට බොහෝ සාධක හමුවන්නේ ද මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම් අතරිනි. එම සිතුවම් විවිධ තේමා සහ වස්තු විෂයන් යටතේ චිත්‍රණය වී ඇති අතර එහි දී උද්භිද විද්‍යාත්මක රූ සටහන් ප්‍රබල භූමිකාවක් නිරූපනය කරනු ලබයි. මහනුවර සම්ප්‍රදායේ බිතුසිතුවම් තුළ සෑම අවස්ථාවක ම ගසක් සිතුවම් කිරීම සම්ප්‍රදායක් ලෙස සිදු කර ඇත. එය චූල කලා සම්ප්‍රදායේ අංගයක් ලෙස දැක්විය හැකිය. ගස් නිරූපණය කිරීම කාරණා කිහිපයක් ඔස්සේ සාකච්ඡා කළ හැකිය. -එනම් කථාවෙහි තේමාවට ගසක් අවශ්‍ය නොවූ අවස්ථාවල පරිසර අලංකාරය, අවකාශය පිරවීම, කථාවස්තුවේ අවස්ථා වෙන්කර පෙන්වීමට සහ වියන් අලංකරණය ආදී වශයෙනි. එසේ සිදුකර ඇත්තේ ද චූල කලා සම්ප්‍රදායේ අංගයක් ලෙසය. එම සිතුවම් චිත්‍රණය කිරීමේ දී ස්වභාවික සහ ශෛලිගත යන ක්‍රමවේදයන් භාවිත කර තිබෙන අතර එබැවින් ස්වභාවික සහ සංකල්පිත යන කාණ්ඩ ඔස්සේ එය වර්ගීකරණය වී තිබේ. මෙම පර්යේෂණය මගින් දකුණු පළාතේ හම්බන්තොට, ගාල්ල සහ මාතර යන දිස්ත්‍රික්කයන්ට අයත් මුල්ගිරිගල රජමහා විහාරය, කසාගල රජමහා විහාරය, දොඩන්දූව ශෛලබිම්බාරාමය, අම්බලන්ගොඩ සුනන්දාරාමය, මිරිස්ස සමුද්‍රගිරි විහාරය සහ උඩපීක්වැල්ල ගංගාතිලක විහාරය තුළ මහනුවර සම්ප්‍රදායට අයත් සිතුවම්හි උද්භිද විද්‍යාත්මක රූ සටහන් බහුලව නිරූපණය කර ඇති බැවින් එම ස්ථාන ආශ්‍රිතව ප්‍රස්තුත මාතෘකාවට අදාල විමර්ශන සිදු කරන ලදී. මේ සඳහා ක්ෂේත්‍ර ගවේෂණය සහ පුස්තකාල අධ්‍යයන යන ක්‍රමවේද භාවිත කරන ලදී. අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා උද්භිද විද්‍යාත්මක රූ සිතුවම්හි සිදු වූ ශෛලිගත වෙනස්කම් සහ සිතුවම් සඳහා යොදාගනු ලැබූ ශාක, ලියවැල් සහ මල් වර්ග පිළිබඳව මෙහි දී විශේෂ අවධානය යොමු කරනු ලබයි. ඒ අනුව සිතුවම් සඳහා භාවිත කර ඇති උද්භිද රූ සටහන්, වර්ණ, පසුබිම සැකසීම සහ තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ සිතුවම් වර්ගීකරණයට ලක් කිරීමෙන් දක්ෂිණ ලංකාවේ චිත්‍ර කලාවේ භාවිත උද්භිද විද්‍යාත්මක පසුතලයන් හඳුනා ගැනීමට අපේක්ෂා කෙරේ.

***ප්‍රමුඛ පද:*** *මහනුවර යුගය, සිතුවම්, උද්භිද විද්‍යා, සංස්කෘතිය, දකුණු පළාත*